ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

ශ්‍රී ලාංකික සිසුන්ට ශිෂ්‍යත්ව

2020-21 අධ්‍යයන වර්ෂය සඳහා ආයුෂ් ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ආයුර්වේද, යෝගා, යුනානි, සිද්ධ සහ හෝමියෝපති යන විෂය ක්ෂේත්‍රයන්හි උපාධි/ පශ්චාත් උපාධි / ආචාර්ය උපාධි සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලාංකික සිසුන්ගෙන් අයදුම්පත් කැඳවයි.

ශ්‍රී ලංකා රජයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ (MoHE) උපදෙස් පරිදි මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ඉන්දීය රජය දක්ෂ ශ්‍රී ලාංකික සිසුන් තෝරා ගනී.

මෙම ශිෂ්‍යත්ව මඟින් සම්පූර්ණ පාඨමාලා ගාස්තු සහ පාඨමාලාවේ මුළු කාලය සඳහා මාසික ආහාර දීමනාවක් ආවරණය කරයි. ශිෂ්‍යත්වයට නවාතැන් දීමනාවක් සහ වාර්ෂික ප්‍රදානයක් ද ඇතුළත් වේ. මීට අමතරව, ඉන්දියාවේ සියලුම ICCR ශිෂ්‍යත්වලාභීන්ට පූර්ණ සෞඛ්‍ය පහසුකම් ලබා දී ඇත.

අවශ්‍ය තොරතුරු උසස් අධ්‍යාපන , තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන www.mohe.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. උනන්දුවක් දක්වන අපේක්ෂකයින් වැඩිදුර තොරතුරු සඳහා කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය අමතන්න (විද්‍යුත් තැපැල - eduwing.colombo@mea.gov.in/ 0112421605, 0112422788 ext-605). උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය සඳහා අයදුම්පත් භාරදිය යුතු අවසාන දිනය 2020 ජුනි 01 වේ.

කොළඹ

ශක වර්ෂ 1942 වෛශාක 22

2020 මැයි 12